# වනපතු සටහන්

My immense gratitude to the great Noble council of Akanitta brahma realm

29/09/2014

මච්ඡරිය, සාඨෙය්‍ය, දුසිල් බව යන ත්‍රිකෝණය සිහිකරන්න




යමෙක් වනයක වාසය කරන්නේ දුස්සීල භාවයට තුඩුදෙන්නා වූ සංඥා, සංස්කාරයෝ සිතට ඇතුල් වන්නේ නම්, එය නිවනට බාධාවක් වන්නේය.

1. එම සිතුවිලි නිසාම ඔහුට මච්ඡරිය ඇති වන්නේ නම් සතිය නොපවතී.
2. මෙසේ නිවනින් පිටත දෙයක් ගන්නේ නම් සාඨෙය්‍ය වන්නේය. වංචාව වූයේය. අසමාහිතභාවය මෙය වන්නේය.

සමාධිය සඳහා මෙසේම සිතිය යුතුය. මෙම වනයට වී සමාධි සහගත සිතින් ජීවිතය පවත්වමි, මෙසේ ජීවත් වෙමි, මරණින් මතු යම් උත්පත්තියක් වන්නේ ද, එය හොඳ වූ ලෝකයක් යැයි සිතා බන්ධනයක් ඇති කර ගන්නේ ය.

- මෙය ආහාර පහසුවෙන් ලැබෙන අවස්ථාවේත්, නො ලැබෙන අවස්ථාවේත් විය හැක.

සාඨෙය්‍ය නිසා අශ්‍රද්ධාව වන්නේය, මෙවිට ද්වේශයේ සිට උද්දච්චය කරා ගමන් කරයි යනුවෙන් බොජ්ඣඞ්ග සටහන් වල 2 පිටුවේ දී ඉගෙන ගෙන ඇත.




උද්දච්චය ඇතිවිට අවිද්‍යා යෝගයේ සිට අවිද්‍යා ආශ්‍රවය දක්වා ගමන් කරයි.




දැන් නොසංසිඳුනු සිත (අවුපසන්ත චිත්තය) ඇතිවී ඇත. අවිද්‍යා ආශ්‍රවයේ සිට කාම ආශ්‍රවය දක්වා ගමන් කරයි.

- මෙම පථය ඔස්සේ රූපය නැවත ස්පර්ශ කරයි.
- අවිද්‍යා අනුසය මගින් සංඥාව උස්සයි. මිච්චාදිට්ඨික සංඥාව මගින් ඊර්ෂ්‍යාව, මායාව, මිච්චාදිට්ඨිය, රතු ත්‍රිකෝණය සාදයි. මෙසේ නැවතත් මිච්චාදිට්ඨික සංඥාව නිසා වන ක්‍රියාවලිය සිදුවේ.







මෙහිදී ගැලවීමක් නැත. කුමක් නිසාද? යමක් පටන් ගත්ත තැනට නැවතත් පැමිණ ඇති නිසාය. මෙසේ අශ්‍රද්ධා වී ජීවත් වීම පවත්වයි. නිරෝධය නොදනී.

උද්දච්චය මගින් රතු ත්‍රිකෝණය (පිටුව 4) සහ දම් ත්‍රිකෝණය සම්බන්ධ කරයි. උද්දච්චයට හේතුවන කාරණා මොනවාද? ද්වේශය, ථීනමිද්ධය, අශ්‍රද්ධාව යන තුනයි.

- ද්වේශය ඇතිනම් රෝගී සංඥාව මගේ යැයි ගෙන ජීවත්විය හැකි යැයි සිතා ඇත. ද්වේශය ඇතිවීමට පෙර ථීනමිද්ධය වී ඇත (සම්මාවාචා සටහන). ද්වේශයෙන් උද්දච්චය.
- ථීනමිද්ධයෙන් උද්දච්චය. ව්‍යාපාදයෙන් ථීනමිද්ධය.
- අශ්‍රද්ධාව මගින් උද්දච්චය. අශ්‍රද්ධාව යනු දුස්සීල භාවයම නොවේද? එසේනම් දුස්සීල භාවයම උද්දච්චය ඇතිවීමට හේතු වී ඇත.




නොසංසිඳුනු සිත (අවුපසන්ත චිත්තය) නිසා දුසිල් බව ඇති වන බව අපි දනිමු. නිර්වාණයෙන් පිටත දෙයක් ගන්නේ නම් සංස්කාරවල සමානතාවක් නැත.

දුස්සීල භාවය තුල අභිජ්ජා ඇත්තාහුය. එනම් මිච්චාදිට්ඨික සංඥාව නිසා විඤ්ඤාණය පැවතීම ඇත. සාධෙයා වීමට මෙයම හේතු වන්නේය. මෙය අවිද්‍යා හේතුවෙන් සංස්කාර වශයෙන් සැලකිය යුතුය.

සාධෙයාට ප්‍රත්‍ය වන්නේ මච්ඡරියයි. මච්ඡරිය හැම රවුමකම පවතී. මච්ඡරිය පැවත්වීම සඳහා දුස්සීල භාවය භාවිතා කරයි.



සායෙයා ඇතිවීමට හේතුව අභිජ්ජාව යැයි ද, මෙය අවිද්‍යා හේතුවෙන් සංස්කාර වශයෙන් සැලකිය යුතුයි යනුවෙන් 5 වන පිටුවේදී ඉගෙන ගත්තා. එනම්, අවිද්‍යාව විඤ්ඤාණයට බීජ වේ. යමක් බීජ වේ ද ඒ හේතුව නොසිදී පවතී. නො සිදී පවත්නේ ප්‍රතිසන්ධානය(relinking) කෙරෙයි.




අරූප ධ්‍යානයට ඇලීම සමුද්ඝාත නොකිරීමම තමයි අවිද්‍යා අනුසය. අවිද්‍යා අනුසය වේදනාව හා සම්බන්ධව පවතී. අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර යනුවෙන් පවසන විට, මෙහි ප්‍රත්‍යය වන්නේ අවිද්‍යා අනුසය වේ. මෙයින් අවිද්‍යා ආශ්‍රව ඇතිවේ. අවිද්‍යා ආශ්‍රව හේතුවෙන් සංස්කාර ඇතිවේ.

- මච්ඡරිය වේදනාව වටාය. මච්ඡරිය ඇතිවීමට ප්‍රත්‍යය වන්නේ අවිද්‍යා අනුසය වේ, හේතුව වන්නේ පලාසයයි.